# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,509 - 2026 ඔක්තෝබර් මස 02 සිකුරාදා - 2026.10.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 4456 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | 4470 |


***සැ.යු.***: (i) ආගමන පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 23 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 09 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය [www.documents.gov.lk](http://www.documents.gov.lk) වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

වෘත්තීය අධ්‍යාපන අංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ක්ෂේත්‍ර සහායක (කම්කරු) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ක්ෂේත්‍ර සහායක (කම්කරු) තනතුරේ පවතින පුරප්පාඩු (99) ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ක්ෂේත්‍ර සහායක (කම්කරු) | **99** |

**1. සේවා ගණය පිළිබඳ විස්තර :**

1. පරිපාලනමය හා ආයතනික කාර්යයන්වලට අවශ්‍ය සේවාවන් ඉටු කිරීම හා පරිශ්‍රයන්හි නඩත්තු කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම, ගොවිපල පවත්වාගෙන යනු ලබන කාර්මික විද්‍යාලයන් හි එම ගොවිපලවල කම්කරු රාජකාරි නිසියාකාරව කරගෙන යාමට අවශ්‍ය සේවය ලබාදීම, කාර්මික විද්‍යාලයන්හි ගෙවත්ත පරිශ්‍රයේ පිරිසිදු කිරීම් හා නඩත්තු කටයුතු ඉටු කිරීම, ගොවිපල කටයුතුවලට අදාළ කම්කරු ක්ෂේත්‍රයේ රාජකාරි.

2. තනතුරට අදාළව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

**2. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

| *තාක්ෂණ/ කාර්මික විද්‍යාලයේ නම* | *බඳවා ගැනීමට නියමිත ප්‍රමාණය* |
|---|---|
| අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | 4 |
| බදුල්ල තාක්ෂණ විද්‍යාලය | 4 |
| යාපනය තාක්ෂණ විද්‍යාලය | 2 |
| මහනුවර තාක්ෂණ විද්‍යාලය | 4 |
| කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | 8 |
| මරදාන තාක්ෂණ විද්‍යාලය | 4 |
| රත්නපුර තාක්ෂණ විද්‍යාලය | 4 |
| ආණමඩුව කාර්මික විද්‍යාලය | 4 |
| බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | 5 |
| දඹුල්ල කාර්මික විද්‍යාලය | 8 |
| දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | 8 |
| ගම්පහ කාර්මික විද්‍යාලය | 5 |
| හසලක කාර්මික විද්‍යාලය | 5 |
| හෝමාගම කාර්මික විද්‍යාලය | 2 |
| කෑගල්ල කාර්මික විද්‍යාලය | 4 |
| මන්නාරම කාර්මික විද්‍යාලය | 2 |
| මාතලේ කාර්මික විද්‍යාලය | 2 |
| මොණරාගල කාර්මික විද්‍යාලය | 5 |
| නුවරඑළිය කාර්මික විද්‍යාලය | 3 |
| රත්මලාන කාර්මික විද්‍යාලය | 2 |
| ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | 2 |
| වවුනියාව කාර්මික විද්‍යාලය | 5 |
| වරකාපොල කාර්මික විද්‍යාලය | 3 |
| වාරියපොල කාර්මික විද්‍යාලය | 2 |
| වීරවිල කාර්මික විද්‍යාලය | 2 |
| **එකතුව** | **99** |

**3. අවශ්‍ය සුදුසුකම් :**

3.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

**3.2 වෘත්තීය සුදුසුකම් :**

තනතුරේ කාර්යයන්ට අදාළව වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

3.3 පළපුරුද්ද : තනතුරේ කාර්යයන්ට අදාළව පළපුරුද්ද ලබා තිබීම සුදුසුකමක් සේ සැලකේ.

**3.4 කායික යෝග්‍යතාව :**

සෑම අපේක්ෂකයකුටම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**3.5 වෙනත් සුදුසුකම් :**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණත්වය ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළවන වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු වේ.

V. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

VI. සේවය කරන ලෙස ඔබට නියම කෙරෙන දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද, මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ඔබ බැඳී සිටී.

5. වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

6. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය (PL1 - 2025) රු. 40,000-450x10-490x10-540x10-12x590- රු. 61,880/-

7. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද | 40 |
| බාහිර ක්‍රියාකාරකම් | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| එකතුව | 100 |

08. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරුවන් විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

    I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

    II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන් විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ අයදුම්පත් 2026.10.30 වැනි දිනට හො ඊට ප්‍රථමව "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ - 10" ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ක්ෂේත්‍ර සහායක (කම්කරු) තනතුරට බඳවා ගැනීම." යනුවෙන් සඳහන් කළ යුතු ය.

III. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

IV. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත්, භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ කොමසාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 47,615.00 ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරනු ලබන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට ද කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

**ඩී. වත්සලා මාරඹගේ,**
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු
කිරීමේ දෙපාර්තමේන්තුව.

2026 සැප්තැම්බර් මස 22 දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ක්ෂේත්‍ර සහායක (කම්කරු) තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

අයදුම් කරන භාෂා මාධ්‍යය:
සිංහල - 1
දෙමළ - 2
**සටහන :** අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

---

**1.** 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................
(සිංහලෙන් / දෙමළෙන්) ..........................................................

1.2 සම්පූර්ණ නම : ..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) : ..........................................................
(සිංහලෙන්/ දෙමළෙන්) උදා : ජේ. එස්. ඩී. කේ. එස්. පෙරේරා

1.4 මුලකුරු සමග නම : ..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

**2.** 2.1 පෞද්ගලික ලිපිනය : ..........................................................
(සිංහලෙන්/ දෙමළෙන්) ..........................................................

**3.** 3.1 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................

3.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ..........................................................

**4.** උපන් දිනය : වර්ෂය : .............................. මාසය: ........................ දිනය: ..............................

**5.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ......................... මාස : ...................... දින : ....................

**6.** ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

**7.** දුරකථන අංකය : ..........................................................

**8.** ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ පුරුෂ ☐ ස්ත්‍රී (අදාළ කොටුව තුළ x සලකුණ යොදන්න)

**9.** විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන බව : ..........................................................

**10.** අධ්‍යාපන සුදුසුකම් :

10.1 පළමු වර අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගය :

වර්ෂය : ......................................... විභාග අංකය : ................................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගය :

දෙවන වර

වර්ෂය : ......................................... විභාග අංකය : ................................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

10.2 අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උ.පෙළ) විභාගය (අදාළ වේ නම් පමණි)

වර්ෂය : ......................................... විභාග අංකය : ................................................

| | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |

10.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| | *පාඨමාලාව/ සහතිකය* | *ලබාගත් ආයතනය* | *පාඨමාලා කාලය* |
|---|---|---|---|
| | | | |

10.4 වෘත්තීය සුදුසුකම් :

| | පාඨමාලාව/ සහතිකය | ලබාගත් ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|---|
| | | | |

10.5 සේවා පළපුරුද්ද :

| | ආයතනය | තනතුර | කාල සීමාව |
|---|---|---|---|
| | | | |

10.6 බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරය :
.............................................................................................................
.............................................................................................................

**11.** ඔබ රජයේ තනතුරක් දරමින් සිට සේවයෙන් පහකර තිබේ ද?

ඔව් ☐ නැත ☐

11.1 ඔව් නම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න ...........................................................................................

**12.** දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද?

ඔව් ☐ නැත ☐

12.1 ඔව් නම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න ...........................................................................................

**13.** ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද?

ඔව් ☐ නැත ☐

13.1 ඔව් නම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න ...........................................................................................

**14.** අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇති සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි නොවන බවත්, මවිසින් කරන ලද ප්‍රකාශය

අසත්‍යයැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

දිනය : ...................................

..............................,
අයදුම්කරුගේ අත්සන.

**15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................................................ මයා/ මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය මා ඉදිරිපිට දී ....................................................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි .

සම්පූර්ණ නම :..........................................................................
තනතුර :..........................................................................
දිනය :..........................................................................
(නිල මුද්‍රාව සනාථ කරන්න)

.......................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

**16.** දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය ( රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සඳහා පමණයි) :

මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන .............................................................. මයා/මිය/ මෙනවිය දැනට .................................................................................. තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය. / නොහැකි ය.

සම්පූර්ණ නම :.................................................................................................................................
තනතුර :.................................................................................................................................
දිනය :.................................................................................................................................
(නිල මුද්‍රාව සනාථ කරන්න)

.......................................................,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

#### මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 02 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | හක්මන | කන්දබඩ පත්තුව මී ඇල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |
| මාතර | වැලිගම | ගල්බොක්ක කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

10 - 380

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**ගාල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 නොවැම්බර් මස 02 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 23 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ඉමදූව | අහුළුගහ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා තල්පෙපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නියාගම | වත්තහේන කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නාගොඩ | නාගොඩ කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | අම්බලන්ගොඩ | වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ (අම්බලන්ගොඩ) විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | අම්බලන්ගොඩ | වැල්ලබඩ පත්තුව අම්බලන්ගොඩ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම

සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 8(1) වගන්තිය සහ එහි ව්‍යතිරේඛය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ 2027.01.01 දින සිට ඇතිවීමට නියමිත පුරප්පාඩුව සඳහා නිර්දේශ කරනු ලැබීමට සලකා බැලීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව සහ ඉහත කී පනතේ විධිවිධාන ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන්, පහත සඳහන් ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තන් විය යුතු ය :-

i. නීතිය;
ii. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම;
iii. වෝහාරික විගණනය;
iv. වෝහාරික ගිණුම්කරණය;
v. ඉංජිනේරු විද්‍යාව,
vi. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍යතාන්ත්‍රික සේවා;
vii. මහජන කටයුතු කළමනාකරණය; හෝ
viii. රාජ්‍ය පරිපාලනය.

අයදුම්කරුවන් විසින්, පත්වීමට අදාළ සුදුසුකම් සහ නුසුදුසුකම් සම්බන්ධයෙන් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ සඳහන් විධිවිධාන කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) 'ක්ෂණික පිවිසුම්' යටතේ 'අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 ඔක්තෝබර් මස 16 වැනි දින හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයේ විෂයය ලෙස 'අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,

2026 ඔක්තෝබර් මස 01 වැනි දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

10 - 403

---

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

### පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ - මූල්‍ය - **( HM 1-1)** | **01** |

01. **තනතුරු නාමය - අධ්‍යක්ෂ මූල්‍ය**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - (HM 1-1)**
**පුරප්පාඩු ගණන - 01**

**1.1 සුදුසුකම් :**

**1.1.1 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනයේ සාමාජිකත්වය ලබාතිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරි ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම.

*සමග*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහතුනක) පළපුරුද්දක් තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය;

*සහ*

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/මණ්ඩලයක/දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 ක පළපුරුද්දක් තිබීම.

**1.1.2** අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍යම කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3ක (තුන) අදාළ විෂයය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*සමග*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

**1.2** වයස:

**අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

**1.3.** වැටුප් කේත අංකය - HM 1-1

**1.4.** මාසික වැටුප් පරිමාණය -

(HM 1-1 ක.ව. 01/2025 (රු. 140,640 - 15 x 4,100 - රු. 202,140/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමි වේ.)

*සැ. යු.* මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක. චක්‍රලේඛ 01/2025 අනුව ලබා දේ.

**මෙම තනතුරු සඳහා පොදු කරුණු :**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු යි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍ය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.nddcb.gov.lk වෙත පිවිස, **"වෘත්තීන්"** (https://www.nddcb.gov.lk/sinhala/careers.php) හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දෘඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ඔබ අයදුම් කරන තනතුරට අදාළ සහතිකපත්වල ඡායා පිටපත් සමග ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කළ යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත ය.

**අයදුම්පත් ගාස්තුව**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්

"අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ කෝපරේට් ශාඛාවේ (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතු ය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමග **2026.10.23** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Download) කරන ලද අයදුම්පත හැර යොමු කරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

**සභාපති,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.**

**ප්‍රකාශිත දිනය : 2026 ඔක්තෝබර් මස 02 වැනි දින,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ,**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

10 - 410

---

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය)**

**තනතුර : පරිපාලන නිලධාරි 01**

**1.** වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**2.** අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන්**
1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ වාණිජ/ රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය කළමනාකරණය/ කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**
1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA 1) සේවා ශ්‍රේණියෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.** සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යසාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| **මුළු ගණන** | **ලකුණු 100** |

**4.** වැටුප් පරිමාණය : JM 1-1 - 2025 – රු. 72,650 - 10 x1,360 – 18x2,040 – රු. 122,970/- 2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ.
(2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 65,633/- කි.)

**තනතුර : ඉංග්‍රීසි උපදේශක 02**

**1.** වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**2.** අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය / ඉංග්‍රීසි පිළිබඳ උපාධිය;

*හෝ*

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමට නොඅඩු මට්ටමක ඉංග්‍රීසි ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**3.** සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කාර්යසාධනයන් / කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| **මුළු ගණන** | **ලකුණු 100** |

**4.** වැටුප් පරිමාණය : MA 4 - 2025 – රු. 64,320 – 10x1,360 – 15x1,670 – 5x2,040 – රු. 113,170/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ.
2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 58,598/- කි.)

5. තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් (EPF) ගෙවිය යුතු ය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සේවා කොන්දේසි**

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට 2026.10.16 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ, අපැහැදිළි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම්පත් ලකුණු ලබාදීමේ නිර්ණායකයන් පදනම් කරගනිමින් කෙටි ලැයිස්තුගත (shortlist) කරනු ලැබේ. (රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,

2026 ඔක්තොබර් මස 02 දින,
ලියනගේමුල්ල,
සීදූව.

10 - 434

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රසම්පාදන නිලධාරි - III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රසම්පාදන නිලධාරී - III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රසම්පාදන නිලධාරී - III ශ්‍රේණිය සඳහා වේ.

1.2 අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026/10/ 26 වේ.

***සටහන :-*** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතු ය.

ලිඛිත විභාගය :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

i. බුද්ධි පරීක්ෂණය
ii. ප්‍රසම්පාදනය සහ කළමනාකරණය

විභාග දිනය - මෙම විභාගය 2027 ජනවාරි මස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මගින් පැවැත්වෙනවා ඇත. එකී විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරිට බලය ඇත.

**02.** පත් කරනු ලබන සංඛ්‍යාව 04කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 91 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**03. සේවා කොන්දේසි :**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/02/2015 හා 2016.04.19 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද, අංක 2310/29 හා 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලටද, යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

3.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

3.4 අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ විධිවිධාන අනුව ඔබ විසින් අදාල පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

3.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට දුම්රිය සාමාන්‍යාධිකාරිට බලය ඇත.

**04. මාසික වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 53,060/= - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 5 x 1,350 - 94,100/= (MN 4 - 2025) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛනයේ III හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කළට දෙනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**05. බඳවා ගැනීමේ සුදුසුකම් / පළපුරුද්ද :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(*අ*) අධ්‍යාපන සුදුසුකම් :

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණිතය, විද්‍යාව, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, වාණිජ්‍ය, ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම;

*හෝ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ධාරාවකින් ලැබූ උපාධියක් සමග ප්‍රසම්පාදන ක්ෂේත්‍රය පිළිබඳ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.

***සටහන*** **-** උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

වයස :

අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසි එකට (21) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස්පහට (35) නොවැඩි විය යුතුය.

(*ආ*) වෙනත් :

i. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* / වෙබ් අඩවියේ සඳහන් කර ඇති අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.10.26 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
ii. කුමන හෝ ආගමක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.
iii. කරුණු අංක 5. අ. ii. හි කියවෙන සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ආයතනය විසින් විධිමත්ව ලබා දෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

**06. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රුපියල් 1,200.00කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරිගේ, මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-290-27313 ට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**07. අයදුම්කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමු වන පිටුවට ද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවටද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකි ය. අයදුම්පතේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද? යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත් වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026/10/26 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන නිලධාරි - III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් බාර ගනු නොලැබේ.

**දුම්රිය සාමාන්‍යාධිකාරි,**
**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 355,**
**ඕල්කට් මාවත**
**කොළඹ 10**

(ඈ) අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240.00 කට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ www.railway.gov.lk යන වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ වට්ස්ඇප් (Whatsapp) අංකයක්ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තව ද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**08. විභාගයට ඇතුළුවීම :**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනය සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති

අයදුම්කරුවන් වෙත, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතු ය. සෑම අයදුම්කරුවෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

*සටහන* - අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**09. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය :**

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

**11.** මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

(අ) විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතු ය.

(ඇ) අයදුම්කරුවෙකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන් හා භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත් වූ විෂයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අයදුම්කරුවකු ප්‍රධාන විෂය සමත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන* -

i. ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම්ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 (අ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

ii. අයදුම්කරුවෙකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

iii. තම අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවෙකුට ඉඩ දෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

13.1 ලිඛිත විභාගය

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුතු ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයන් සහ එක් එක් විෂය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 02. ප්‍රසම්පාදනය සහ කළමනාකරණය | 100 | 40 |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

01. **බුද්ධි පරීක්ෂණය**
අයදුම්කරුගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාව පරීක්ෂා කිරීමට හැකිවන අයුරින් සකස් කරන ලද බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. (කාලය පැය 01 යි).

02. ප්‍රසම්පාදනය සහ කළමනාකරණය :

අයදුම්කරුගේ,

i. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ප්‍රසම්පාදන උපදෙස් සංග්‍රහය පිළිබඳ දැනුම.
ii. ප්‍රසම්පාදන සැලසුම්කරණය සහ ප්‍රසම්පාදන ලියකියවිලි සැකසීම පිළිබඳ දැනුම.
iii. ගබඩා කළමනාකරණය.
iv. මිල ඇගයීමේ ක්‍රියාවලිය.
v. සැපයුම් කළමනාකරණය.
vi. ලන්සු ඇගයීම.
vii. කොන්ත්‍රාත්තු කළමනාකරණය.
viii. ගිවිසුම් පරිපාලනය.
ix. ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා අර්ථදායී ලෙස රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටු කිරීම.
x. අවධානම් කළමනාකරණය, රාජ්‍ය වත්කම් අපහරණය සහ කොන්ත්‍රාත් අවසන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම පිරික්සීම සඳහා වූ කෙටි පිළිතුරු සැපයීම හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය (කාලය පැය 03යි).

13.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

(i.) ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කර එයින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

(ii.) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන අතර එම පරීක්ෂණය පැවැත්වෙන දිනය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත.

(iii.) එහිදී ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ පහත පරිදි වේ -

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 |
| 02 | වෘත්තීය සුදුසුකම් | 20 |
| 03 | පළපුරුද්ද | 25 |
| 04 | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 20 |
| 05 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 20 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 05 |
| | **මුළු ලකුණු** | **100** |

***සටහන* -** පළපුරුද්ද යටතේ ලකුණු ලබාදීමේ දී 5 (අ) (ii) යටතේ දක්වා ඇති සුදුසුකම් මත බඳවා ගන්නා විට දී, බඳවා ගැනීම සඳහා සලකා බලන ලද වසර 02ට අමතර පළපුරුද්දක් සඳහා පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබයි.

***සැලකිය යුතු යි :-*** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**14.** විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.railway.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

**15.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රවින්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 සැප්තැම්බර් මස 23 දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

***ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ප්‍රසම්පාදන නිලධාරි - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026***

***Open Competitive Examination for Recruitment to Procurement Officer Grade - III in Sri Lanka Railway Department - 2026***

**1.0** මාධ්‍ය :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

- සිංහල - 2
- දෙමළ - 3
- ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0. පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..................................................................................

..................................................................................................................

(උදා:HERATH MUDIYANSELAGE SAMAN KUMARA KARUNARATHNE)

2.2. සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :..................................................................................

..................................................................................................................

2.3. මුලකුරු සමග නම :..................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා:- KARUNARATHNE H.M.S.K.)

2.4. මුලකුරු සමග නම (සිංහලෙන් /දෙමළෙන්) :..................................................................................

..................................................................................................................

2.5. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..................................................................................

.................................................................. (ප්‍රවේශපත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

2.6. ස්ත්‍රී/ පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී -1
පුරුෂ -0

2.7. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.8. විවාහක/ අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විවාහක - 1
අවිවාහක - 2

2.9. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) :

2.10. උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

2.11. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

2.12. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |
(WhatsApp Number)

03. උපාධිය ලද දිනය : ............................................................................................................
විශ්වවිද්‍යාලය/ ආයතනය : ............................................................................................................
ලියාපදිංචි අංකය : ............................................................................................................
අභ්‍යන්තර / බාහිර : ............................................................................................................
උපාධිය : ............................................................................................................
විෂයයන් : ............................................................................................................
පන්තිය : ............................................................................................................
ඉහළ/ පහළ: ............................................................................................................
උපාධිය වලංගු දිනය : ............................................................................................................
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ............................................................................................................

04. විභාග ගාස්තු ගෙවීම :

(i.) ගෙවන ලද මහජන බැංකු ශාඛාව :
(ii.) ගෙවූ මුදල :
(iii.) ගෙවූ දිනය :

| |
|---|
| මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) මෙහි අලවන්න.<br>(මුදල් තැන්පතු පත්‍රිකාවේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.) |

05. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

දිනය - ..................

..................,
අයදුම්කරුගේ අත්සන.

06. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 7(ඈ) පරිදි විය යුතු ය.) :
මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .......................................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ........... දින ඔහුගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

……………………………….,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ………………………………………………………………………
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ………………………………………………………………………
තනතුර : ………………………………………………………………………
ලිපිනය : ………………………………………………………………………
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.).

7.0. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය / පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන …………………………………………………………… මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ /ආයතනයේ …………………………………………………………… ලෙස සේවය කරන අතර ඔහුගේ/ ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි ය.

…………………………,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ………………………………………………………………………
පදවි නාමය : ………………………………………………………………………
දිනය : ………………………………………………………………………
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.).

10 - 336

---

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

විවෘත පදනම මත අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගය - 2026

01. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති “Online Application - Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි, මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 නොවැම්බර් මස 02 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ, අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී III ශ්‍රේණියට තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සමාන්‍ය අධ්‍යාපන අංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිය රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුන (03) ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර තුන (03) ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුයි.

(ඈ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් සුදුසුකම් සපුරාලනු ලැබූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

04. 2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර, එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - 78,360 ක් වන අතර, එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන අකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

06. තනතුරට අයත් කාර්ය භාරය :

I. නේවාසික සිසුන්ගෙ විනය, ආරක්ෂාව, සුබසාධනය හා ආහාර සැපයීම යන කටයුතු කර ගෙන යාම හා එම කටයුතු ඉටුකරලීමේදී ශිෂ්‍ය නිවාසාධිකාරිට සහාය දැක්වීම, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුභසිද්ධිය, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීම, විනය පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ පොත්පත් ලේඛන පවත්වාගෙන යාම, ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම, ආරක්ෂා කිරීම, මුළුතැන්ගෙට නිකුත් කිරීම පිළිබඳ කටයුතු, ආහාරපාන පිසීම පිළිබඳ පරීක්ෂා කිරීම. මුළුතැන්ගෙයි මෙවලම් පිළිබඳ පවිත්‍රතාව, නේවාසිකාගාර පිරිසිදුව තැබීමට විධිවිධාන යෙදීම, නේවාසික සිසුන්ගේ ආරක්ෂාව, රෝගාතුර වූ සිසුන් පිළිබඳව කටයුතු, රජය සතු දේ සහ සිසුන් සතු දේ ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු, පවිත්‍රතාව පවත්වා ගැනීමට අදාළ කටයුතු, රෝගී සිසුන් පිළිබඳ සොයා බැලීම, ආහාර පාන පිළියෙල කිරීම පිළිබඳ කටයුතු, ආහාර ගන්නා අවස්ථාව පිළිබඳ අධීක්ෂණ කටයුතු, නේවාසිකාගාරවල ජලය, විදුලිය විධිමත්ව සැපයීමට අදාළ කටයුතු, නේවාසිකයන් නේවාසිකාගාරයෙන් බැහැරවීම හා පැමිණීම පිළිබඳ අදාළ කාර්යයන්.

II. තනතුරට අදාළව ආයතන ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාජකාරි

07. සුදුසුකම් : සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය;
(ඇ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;
(ඈ) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය;
(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය;

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත්ව තිබීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍ය සහිතව

එකවර විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සටහන* **:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු භාෂාව අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍ය වේ.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සම්මාන හෝ වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබාගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබා දීම සඳහා අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්ගෙන් තහවුරු කර ගැනීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

අදාළ කර ගැනීම පිළිබඳ අවසන් තීරණය අදාළ ආයතනවලින් සහ විභාග කොමසාරිස් ජනරාල්ගෙන් තහවුරු කර ගැනීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

***සැලකිය යුතුයි.-*** සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

08. විභාග පරිපාටිය : මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය :

| | මුළු ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම සම්මුඛ පරීක්ෂණය | 100 |

I. සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි, ලකුණු 100)

සහකාර ශිෂ්‍යා නිවාස අධිකාරි (පිරිමි) / සහකාර ශිෂ්‍යා නිවාස අධිකාරි (ගැහැනු) තනතුරට අදාළ රාජකාරි හා තනතුරට අදාළ ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

II. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි, ලකුණු 100)

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

III. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 100)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම නිවේදනයේ 10 ඡේදය යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව එම අයදුම්කරුවන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා ලිඛිත විභාගයේ එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබා සමත් විය යුතුය. විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ). ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබාදෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

10. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර ශිෂ්‍යා නිවාස අධිකාරි තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2026

<table>
<tr><th colspan="4">ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td colspan="4">01. අමතර අධ්‍යාපන සුදුසුකම්<br>(a) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ)</td><td rowspan="17">25</td><td rowspan="19">[අදාළ නොවේ.]</td></tr>
<tr><td rowspan="2">සාමාර්ථය</td><td colspan="3">එක් විෂයයකට ලකුණු</td></tr>
<tr><td>මූලික සුදුසුකම් නොවන විෂයයන් සඳහා</td><td>මූලික සුදුසුකම් S වන විට</td><td>මූලික සුදුසුකම් C වන විට</td></tr>
<tr><td>විශිෂ්ට සාමාර්ථය (A)</td><td>ලකුණු 05</td><td>ලකුණු 03</td><td>ලකුණු 02</td></tr>
<tr><td>අධි සම්මාන සාමාර්ථය (B)</td><td>ලකුණු 04</td><td>ලකුණු 02</td><td>ලකුණු 01</td></tr>
<tr><td>සම්මාන සාමාර්ථය (C)</td><td>ලකුණු 03</td><td>ලකුණු 01</td><td>ලකුණු 0</td></tr>
<tr><td>සාමාන්‍ය සාමාර්ථය (S)</td><td>ලකුණු 02</td><td>ලකුණු 0</td><td>ලකුණු 0</td></tr>
<tr><td colspan="3">(b අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ)</td><td rowspan="7"></td></tr>
<tr><td rowspan="2">සාමාර්ථය</td><td colspan="2">එක් විෂයයකට ලකුණු</td></tr>
<tr><td>මූලික සුදුසුකම් නොවන විෂයයන් සඳහා</td><td>මූලික සුදුසුකම් S වන විට</td></tr>
<tr><td>විශිෂ්ට සාමාර්ථය (A)</td><td>ලකුණු 08</td><td>ලකුණු 06</td></tr>
<tr><td>අධි සම්මාන සාමාර්ථය (B)</td><td>ලකුණු 06</td><td>ලකුණු 04</td></tr>
<tr><td>සම්මාන සාමාර්ථය (C)</td><td>ලකුණු 04</td><td>ලකුණු 02</td></tr>
<tr><td>සාමාන්‍ය සාමාර්ථය (S)</td><td>ලකුණු 02</td><td>ලකුණු 0</td></tr>
<tr><td colspan="4">02. පරිගණක පිළිබඳ දැනුම<br>* ඩිප්ලෝමා සහතිකය - 15<br>* සහතිකපත් මට්ටම සඳහා - 10<br>* වෙනත් - 05</td><td>15</td></tr>
<tr><td colspan="4">03. මව් භාෂාව සහ දෙවන භාෂාව හැර වෙනත් භාෂාවන් පිළිබඳ නිපුණතාව.<br>(a) උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය<br>• විශිෂ්ට සාමාර්ථය එක් විෂයයකට ලකුණු 06 බැගින්<br>• අධි සම්මාන සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 05 බැගින්<br>• සම්මාන සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 04 බැගින්<br>• සාමාන්‍ය සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 03 බැගින්<br>(b) ඉංග්‍රීසි ඩිප්ලෝමා - 10<br>සහතික පත්‍ර මට්ටම සඳහා - 10<br>වෙනත් - 02<br>(c) උසස් පෙළ විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව හදාරා තිබීම.<br>• විශිෂ්ට සාමාර්ථය එක් විෂයයකට ලකුණු 08 බැගින්<br>• අධි සම්මාන සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 06 බැගින්<br>• සම්මාන සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 04 බැගින්<br>• සාමාන්‍ය සාමාර්ථය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>(d) වෙනත් ඕනෑම භාෂාවක් සඳහා<br>* ඩිප්ලෝමා/ උසස්පෙළ A සාමාර්ථය - 05<br>* සහතිකපත් / උසස්පෙළ B සාමාර්ථය - 04<br>* වෙනත් / උසස්පෙළ C සාමාර්ථය - 03<br>* උසස්පෙළ S සාමාර්ථය - 02</td><td>15</td></tr>
</table>

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 04. වෘත්තියට අදාළ ඉදිරිපත් කිරීමක් | | |
| • වෘත්තීය පිළිබඳ අවබෝධය | 20 | |
| • කාර්යාල කළමණාකරණය පිළිබඳ දැනුම | 10 | |
| • ඉදිරිපත් කිරීමේ හැකියාව | 10 | |
| • පෞරුෂත්වය | 5 | |
| මුළු ලකුණු | 100 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.)

*සටහන 1*

සහතික ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම්, රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිත තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

*සටහන 2*

ඉහත ලකුණු පටිපාටියේ අංක 04 යටතේ සඳහන් ඉදිරිපත් කිරීම සඳහා උපරිම වශයෙන් විනාඩි 03ක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම්ව පැමිණිය යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

I. අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

12. විභාග කොන්දේසි :

මාර්ගගත (Onling) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E - mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. (අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

13. විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තුව ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු ය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)

(ඇ) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)

(ඈ) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්(Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවනු ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

18. අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මගින් ද, දැනුවත් කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරය ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම තොරතුරු සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගත හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත සහ විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

19. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී හෝ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

20. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගය ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

21 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

22. **විභාගයට ඇතුළත් කර ගැනීම :**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලවේ සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

*සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

23. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පළැදගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකක් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

24. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ WWW.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

25. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්.

2026 සැප්තැම්බර් මස 03 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

10 - 344

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

උක්ත කරුණට අදාළව අයදුම්පත් කැඳවන ලද අංක 2502 හා 2026.08.14 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් අංක 3.4 හා 7.(ඇ) පහත පරිදි සංශෝධනය කරමි.

3.4 අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

7.(ඇ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.10.10 දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරි - III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

මෙම සංශෝධනය හේතුවෙන් අංක 2502 හා 2026.08.14 දිනැති ගැසට් නිවේදනයේ පළකර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය වන 2026.09.14 සංශෝධනය නොවන බව සලකන්න.

මේ වන විට අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු නොවේ.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 සැප්තැම්බර් මස 23 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
බත්තරමුල්ල.

10 - 362

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණය ඖෂධ සංයෝජක III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින ඖෂධ සංයෝජක (කාන්තා/පිරිමි) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඖෂධ සංයෝජක තනතුරේ III ශ්‍රේණිය සඳහා වේ.

II. *ලිඛිත විභාගය :-* මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.
(I) බුද්ධි පරීක්ෂණය
(II) විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම

**02.** **විභාග දිනය සහ විභාගය පැවැත්වීම :**
මෙම විභාගය 2026 දෙසැම්බර් මස කොළඹ නගරයේ ස්ථාපනය කරනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

**03.** පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 27 කි. (III ශ්‍රේණියේ ඖෂධ සංයෝජක (පිරිමි) 19 ක් සහ III ශ්‍රේණියේ ඖෂධ සංයෝජක (කාන්තා) 08කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

**04.** **සේවා කොන්දේසි :**

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව අපේක්ෂකයන් අදාළ තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ඖෂධ සංයෝජක III ශ්‍රේණිය තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්ද, II ශ්‍රේණියට පත්ව වසර 03 ක් ඇතුළත II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්ද, I ශ්‍රේණියට පත්ව වසර 05ක් ඇතුළත III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්ද, සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරට හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

**05.** **මාසික වැටුප් පරිමාණය :**
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි MT -2 – 2025 වැටුප් ඛණ්ඩය අදාළ වේ.

එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.
රු. 50,630 -10 x 630 – 11 x 670 – 10 x 1,010 -10 x 1,190 – රු. 86,300 (මාසික)

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 50,630/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ)

**06.** (අ) **බඳවා ගැනීමේ සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
II. මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
III. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර එය පොලිස් නිශ්කාෂණ වාර්තා මගින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
IV. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.
V. පිරිමි - අවම උස අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතු ය. (162.5 cm).

VI. කාන්තා - අවම උස අඩි 5 අඟල් 2ට නොඅඩු විය යුතුය. (157.5cm).

VII. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය (81.25cm).

VIII. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම මෙම තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

**(ආ) අධ්‍යාපන සුදුසුකම් :**

I. රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂය ධාරාවේ විෂයන් තුන (03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

II. සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව ,ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එක වරක දී, විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

**(ඇ) වෘත්තීය සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06)මට්ටමට අදාළ වන්නා වූ ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

***සටහන :*** ප්‍රමාණවත් වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති අවස්ථාවල දී ඉහත 6(ආ) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන් පුහුණු ශ්‍රේණියට බඳවාගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන පූර්ණ කාලීන අවුරුදු 01ක න්‍යායාත්මක හා සීමාවාසික ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවට ඇතුළත් කරනු ලබන අතර එම පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ඖෂධ සංයෝජක III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

**(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :**

I. ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

II. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

III. III ශ්‍රේණියේ ඖෂධ සංයෝජක නිලධාරි තනතුරට බඳවා ගන්නා තෙක් ඉහත 06 (අ) හි සඳහන් සුදුසුකම් බලපැවැත් වේ.

**(ඉ) වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2008.10.25 දිනට හෝ ඊට පෙර හා 1991.10.25 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**07. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු. 600.00 /- කි. අයදුම්පත භාර ගන්නා අවසාන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල ගිණුම වන ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ අංක 7041491 දරන ගිණුමට දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත මුදල් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත,එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

**8.1** ඉල්ලුම්පත්‍රය මේ සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් “8.27 x 11.69” (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිත කළ හැකිය. ශීර්ෂ අංක 01 සිට 10 තෙක් පළමුවන පිටුවට ද, 11 සිට 15 තෙක් දෙවන පිටුවට ද, 16 සිට 18 දක්වා තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) තව ද සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය.එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

**8.2** ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යයෙන්ම සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

**8.3** සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර **2026.10.25** දින හෝ ඊට පෙර " බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, ආයතන ශාඛාව, බන්ධනාගාර මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඖෂධ සංයෝජක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත පිළියෙළ කර ගන්නා විට,එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

**8.4** ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම් පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවැනි නිලධාරියකු තෝරා ගතහොත් දැනට ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා තහවුරු කර තිබිය යුතු ය.

**8.5** අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර, ඉල්ලා ඇති සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල ඡායා පිටපත් අමුණා ඉදිරිපත් කර නොමැති අයදුම්පත්‍ර, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි ලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

**8.6** ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත.නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතු ය. එහි දී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක් ෆැක්ස් මගින්,විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට එම දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ද සුදුසු වේ. එහි දී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත,විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානම් කොට ඔබ ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

**09.** **විභාගයට ඇතුළු වීම :**

(*අ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ පත්වීම් ප්‍රදානය කිරීම සඳහා සලකා නොබැලීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

(*ආ*) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**10.** **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

**12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ආ) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

**(I) ලිඛිත විභාගය :**
අපේක්ෂකයින් විසින් පහත සඳහන් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (01) බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| (02) විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100% | 40% |

**(II) විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| (01) බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01කි. මුළු ලකුණු 100යි. සිතීමේ තර්කානුකූලතාවයන්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තිය මත හා ගණිතමය හැකියාව මැන බැලීම සඳහා බහුවරණ 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| (01) විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | කාලය පැය 01කි. මුළු ලකුණු 100යි. විෂය ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික දැනුම පරීක්ෂා කිරීම, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු, විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

**(III)** ***සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-*** ලකුණු ලබා දෙනු නොලැබේ. කායික සුදුසුකම් හා අනෙකුත් මූලික සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ලැබේ.

**14.** ඉහත සඳහන් ලිඛිත විභාගයේ විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 හි ලකුණුවල එකතුව මත දක්වන කුසලතා අනුපිළිවෙළ අනුව මෙම තනතුර සඳහා පවතින පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

**15.** නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

**16.** එම අපේක්ෂකයන් ලිඛිත විභාගයේ දී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙළින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් ඖෂධ සංයෝජක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

***සැලකිය යුතුයි :-*** සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.
❖ නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුව බඳවා ගැනීම සඳහා කාන්තා අයදුම්කාරියන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තේරීපත් නොවුණහොත් ඉතිරි පුරප්පාඩු ගණන සඳහා පිරිමි අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.
❖ මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

❖ මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ.).

2026 සැප්තැම්බර් 25 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණය
ඖෂධ සංයෝජක III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

**The Open Competitive Examination for Recruitment to the Post of Dispenser- Grade III in Management Assistant Technical Segment 2 at the Department of Prisons -2026**

- විභාගයට පෙනී සිටින මාධ්‍යය ඉදිරියෙන් √ ලකුණ කොටු තුළ යොදන්න.

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

01. i. සම්පූර්ණ නම : - ..........................................................

ii. මුලකුරු සමග නම (සිංහලෙන්): - ..........................................................

iii. මුලකුරු සමග නම(ඉංග්‍රීසියෙන්): - ..........................................................

02. i ස්ථිර ලිපිනය (සිංහලෙන්) : - ..........................................................

ii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසියෙන්) : - ..........................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : - ..........................................................

04. i. දුරකථන අංකය : - ජංගම ............................ ස්ථාවර ............................

ii. විද්‍යුත් තැපැල් ලිපිනය : - ..........................................................

05. පදිංචි ලිපිනය අයත් වන -

I. දිස්ත්‍රික්කය :- ............................................
II. පොලිස් ස්ථානය :- ............................................

06. උපන්දිනය :- අවුරුද්ද : ☐ මාසය : ☐ දිනය : ☐

07. 2026.10.25 දිනට වයස :- අවුරුදු : ☐ මාස : ☐ දින : ☐

08. ස්ත්‍රී/පුරුෂ භාවය :- පුරුෂ ☐ ස්ත්‍රී ☐

09. පුරවැසිභාවය (පරම්පරාවෙන්/ ලියාපදිංචි වීමෙන්) :- ..........................

10. විවාහක/ අවිවාහක බව :- ☐ විවාහක -1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

11. අධ්‍යාපන සුදුසුකම්(පැහැදිලිව දැක්විය යුතුය) :
අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල
(සහතිකවල ඡායා පිටපතක් අමුණන්න.)

විභාග අංකය : ............................. වර්ෂය : .............................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

12. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල
(සහතිකවල ඡායා පිටපතක් අමුණන්න.)

විභාග අංකය : ............................. වර්ෂය : .............................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |

13 i. පළපුරුද්ද (අවුරුදු) :-.............................................................................

ii. විශේෂ සුදුසුකම :-.............................................................................

14. වෘත්තීය සුදුසුකම් :- .............................................................................................................................
(සහතිකවල ඡායා පිටපතක් අමුණන්න.)

*සැ.යු.* - සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල ඡායා පිටපතක් බැගින් අනිවාර්යෙන්ම අමුණන්න. සහතිකවල ඡායා පිටපත් අමුණා ඉදිරිපත් නොකරන අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. කායික සුදුසුකම් :-
I. උස : අඩි: …………… අඟල්: …………
II. පපුව (හුස්ම නාල්ලා) : අඟල්:…………….. (පිරිමි අයදුම්කරුවන් සඳහා)

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියෙන් වරදකරු කරනු ලැබ තිබේද? ඔව්/ නැත
(ඔව් නම් විස්තර සඳහන් කරන්න.) ......................................................................................................................
......................................................................................................................................................................

17. විභාග ගාස්තු ගෙවීම:-

| *ගෙවන ලද මුදල* | *ගෙවූ බැංකු ශාඛාව* | *ගෙවූ දිනය* | *ලදුපත් අංකය* |
|---|---|---|---|
| | | | |

ලදුපත මෙතනින් අලවන්න.

**18. අයදුම්කරුගේ සහතිකය :-**

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි යැයි විභාගය පැවැත්වීමට පෙර හෙළිවුවහොත්, විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම් දිනෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මාගේ පත්වීම අවලංගු වන බවත් හොඳාකාරව දනිමි.

දිනය: ........................................... .............................................,
අයදුම්කරුගේ අත්සන.

**19. අත්සන සහතික කිරීම:**

**මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන...................................................................................................................**
**.......... මහතා/මිය/මෙය මම පුද්ගලිකව හඳුනමි.ඔහු/ඇය ........................................................ දින ඉහත අත්සන මා ඉදිරියේදී තැබූ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අදාළ ස්ථානයේ අලවා ඇති බවත් සහතික කරමි.**

**දිනය: .......................................... .........................................................,**
**සහතික කරන තැනැත්තාගේ අත්සන.**

**සහතික කරන අයගේ සම්පූර්ණ නම : ........................................................................................................**
**තනතුර : .......................................................................................................................................**
**ලිපිනය : .......................................................................................................................................**
**(කරුණාකර නිල මුද්‍රාව තබන්න)**

**20. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.**
**................................................................................................................. යන අය මෙම ආයතනයේ ...................................... කු/ක වශයෙන් සේවයේ නියුක්ත බවද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවද, ඔහුට/ ඇයට විනය පරීක්ෂණ/ විනය විරෝධි ක්‍රියා ඇති/නැති බවද, තනතුර සඳහා තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ප්‍රකාශ කරමි.**

**දිනය: ....................................... ..............................................................,**
**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.**

**සංශෝධනයයි**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

අංක 2,495 දරන 2026 ජුනි මස 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026" විභාග නිවේදනයේ, 02 වන ඡේදයේ අදාළ වගන්තිය සහ 04 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**02. සුදුසුකම් -**

I. *අධ්‍යාපන සුදුසුකම්* **-** ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

**04. වයස් සීමාව**

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.10.02 දිනට හෝ ඊට පෙර හා 1991.10.02 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

තවද, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන සියලුම සුදුසුකම්, අංක 2,495 දරන 2026 ජුනි මස 26 *ගැසට් නිවේදනයේ* සඳහන් 2026.07.31 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේම මේ වන විටත් අයදුම්පත් යොමුකරන ලද්දේ නම් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

**ඉල්ලුම්පත් භාරගනු ලබන අවසන් දිනය - 2026 නොවැම්බර් මස 02**

ඉහත සඳහන් සංශෝධන හැර, එම *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අනෙකුත් සියලුම කරුණු නොවෙනස් ව බලපැවැත්වේ. (අංක 2,495 දරන 2026 ජුනි මස 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* නිවේදනය අනුව මේ වනවිටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්කිරීම අවශ්‍ය නොවේ.)

**චන්දන රණවීර ආරච්චි,**
ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල්
දෙපාර්තමේන්තුව.

2026 සැප්තැම්බර් මස 28 වැනි දින,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 408

---

**සංශෝධනයයි**

**විගණන සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2026

අංක 2506 දරන 2026.09.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" සඳහා වන විභාග නිවේදනයේ අනු අංක 04 හි සුදුසුකම් යටතේ දක්වා ඇති (ii) වයස සම්බන්ධයෙන් වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

**''අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.''**

02. මෙම බඳවාගැනීම සඳහා අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කළයුතු දිනය මෙමගින් සංශෝධනය නොකෙරේ. ඒ අනුව

බඳවාගැනීම සඳහා සලකා බලනු ලබන සියලුම සුදුසුකම් මුල් අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි දක්වා ඇති 2026 ඔක්තෝබර් 12 දිනට සපුරා තිබිය යුතු ය.

03. තව ද, 2026.09.11 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් සියලු විධි විධාන එලෙසින්ම බල පැවැත්වෙන අතර, මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2026 නොවැම්බර් මස 12 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

04. මෙම විභාගය සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඩී. කේ. විජේසිංහ,**
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

10 - 409

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2026.10.02 | සිකුරාදා | 2026.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.09 | සිකුරාදා | 2026.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.16 | සිකුරාදා | 2026.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.23 | සිකුරාදා | 2026.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.30 | සිකුරාදා | 2026.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2026.11.06 | සිකුරාදා | 2026.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.13 | සිකුරාදා | 2026.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.20 | සිකුරාදා | 2026.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.27 | සිකුරාදා | 2026.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2026.12.04 | සිකුරාදා | 2026.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.11 | සිකුරාදා | 2026.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.18 | සිකුරාදා | 2026.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.24 | බ්‍රහස්පතින්දා | 2026.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.31 | බ්‍රහස්පතින්දා | 2026.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.